# අ.පො.ස. උසස් පෙළ විද්‍යා විෂයධාරාව හදාරන සිසුනගේ උසස් පෙළ සාධනය කෙරෙහි පාසල සහ ශිෂ්‍ය කේන්ද්‍රීය සාධක බලපාන ආකාරය පිළිබඳ විවේචනාත්මක අධ්‍යයනයක්

( අනුරාධපුර දිස්ත්‍රික්කය ඇසුරෙන් )

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධනය

කොළඹ විශ්ව විද්‍යාලය
අධ්‍යාපන පීඨය

UCLIB
470049

එල්. පී. දයාශාන්තිනී
විද්‍යාවේදී උපාධි
(කොළඹ විශ්ව විද්‍යාලය)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා
රන් පදක්කම්ලාභී 1990
(ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය)

## සංක්ෂිප්තය

ශ්‍රී ලංකා සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී විද්‍යා අධ්‍යාපනයට වැදගත් කාර්යය භාරයක් හිමිවේ. තෘතීයික මට්ටමේ විද්‍යා අධ්‍යාපනය සඳහා අවශ්‍ය පදනම සපයනු ලබන්නේ පාසල් විද්‍යා අධ්‍යාපනය තුලිනි. උසස් අධ්‍යාපනය ලබා දෙන ප්‍රධාන අධ්‍යාපන ආයතන වන විශ්ව විද්‍යාලවලට සිසුන් ඇතුලත් කර ගනු ලබන්නේ, ඔවුන් අ.පො.ස. උසස් පෙළ විභාගයේදී ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව අනුවය. එබැවින් විද්‍යා අංශයෙන් උසස් අධ්‍යාපනයට යොමුවන සිසුනට අ.පො.ස. උසස් පෙළ විභාගය ඔවුනගේ ජීවිතයේ වැදගත් සන්ධි ස්ථානයක්වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා විද්‍යා අංශයෙන් පෙනී සිටින සිසුනගේ ප්‍රතිඵල පහත මට්ටමක පවතින බව, විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සංඛ්‍යා ලේඛන අනුව පැහැදිලිවේ. මෙම තත්ත්වයට පාසල සහ ශිෂ්‍ය කේන්ද්‍රීය සාධක බලපාන්නේ කෙසේදැයි විමසා බැලීමක් මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ.

උසස් පෙළ සාධනය යනුවෙන් මෙහිදී අදහස් කරන ලද්දේ උසස් පෙළ රසායන, උද්භිද, සත්ත්ව සහ භෞතික විද්‍යා විෂයයනගේ සාධනයන්ය. අධ්‍යයනය අනුරාධපුර දිස්ත්‍රික්කයේ උසස් පෙළ විද්‍යා විෂය ධාරා ක්‍රියාත්මක වන සිංහල මාධ්‍ය රජයේ පාසල් වලට සීමා විය. එම පාසල් වලින් උසස් පෙළ වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙනුම ලැබූ මධ්‍ය මහා විද්‍යාල දෙකක් සහ මහා විද්‍යාල හතරක් අහඹු ලෙස පර්යේෂණය සඳහා තෝරා ගන්නා ලදී. මෙම පර්යේෂණයේදී පාසල කේන්ද්‍රීය සාධක උසස් පෙළ සාධනය කෙරෙහි බලපාන ආකාරය සහ ශිෂ්‍ය කේන්ද්‍රීය සාධක උසස් පෙළ සාධනය කෙරෙහි බලපාන ආකාරය, අදියර දෙකකින් විමර්ශනයට ලක් විය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 1993 වසරේ පැවැත්වූ අ.පො.ස. උසස් පෙළ විභාගයට පාසල් හයකින් ප්‍රථම වතාවට රසායන, උද්භිද, සත්ත්ව සහ භෞතික විද්‍යා විෂයයනගෙන් පෙනී සිටි සිසුන් සියළු දෙනාම නියැදියට ඇතුලත් කර ගන්නා ලදී. එම සිසුනට රසායන, උද්භිද, සත්ත්ව සහ භෞතික විද්‍යා විෂයයන් උගන්වන ලද ගුරු භවතුන්, විද්‍යා අංශ ප්‍රධානීන් සහ විදුහල්පතිවරුන් නියැදියට ඇතුලත් විය.

පාසල කේන්ද්‍රීය සාධක සාධනය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීමේදී, තෝරාගත් පාසල් හයෙහි සිසුන් 1988 සිට 1993 දක්වා වසරවල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ අ.පො.ස. උසස් පෙළ විභාගවලදී ලැබූ ප්‍රතිඵල භාවිතා කෙරින.

ශිෂ්‍ය කේන්ද්‍රීය සාධක සාධනය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීමේදී, 1993 වසරේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙරාතුව, පාසල් මට්ටමින් පවත්වන ලද වාර පරීක්ෂණයේ ලකුණු භාවිතා කරන ලදී.

මෙම අධ්‍යයනයේදී විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය අනුගමනය කරන ලදී. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා සහ සැසඳුම් පත්‍රිකා ආශ්‍රයෙන් නිරීක්ෂණ, යොදා ගනු ලැබිණ. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රතිශත, ප්‍රස්ථාර සහ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතා කරන ලදී.

පර්යේෂණ ප්‍රතිඵල අනුව, අ.පො.ස. උසස් පෙළ සාධනය කෙරෙහි බලපාන සාධක අනාවරණය කරගනු ලැබිණ. පාසල සහ ශිෂ්‍ය කේන්ද්‍රීය සාධක උසස් පෙළ සාධනය කෙරෙහි එකසේ බලපාන බව නිගමනය කළ හැකිය. පිළිගත්, උසස් යයි සම්මත විදුහල්වල අධ්‍යාපනය ලබන්නාවූ ශිෂ්‍යයනගේ සාධනය, වෙනත් පාසල් වලට වඩා උසස් මට්ටමක තිබෙන බව නිගමනය කළ හැකිය.